රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 3000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**SLS 32613 -** සිංහල කාව්‍ය ශිල්පය

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.
(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.)

කාලය : පැය 03

---

01. "මෙහි වියත් අවියත් සියල් වදනුන් මෙ පහන්
ගුණෙන් පවති සවාරෙන් තෙමෙ ලෝ යා පවත්මින්"

සියබස්ලකරෙහි එන මේ ගීය ඇසුරු කරමින් කාව්‍ය භාෂාවේ භාවිතය සහ එහි වැදගත්කම පිළිබඳ සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

02. පහන් (ප්‍රසාද), උළාර (උදාර), සමාදි (සමාධි) යන කාව්‍ය ගුණත්‍රය පිළිබඳව සනිදර්ශනාත්මක විස්තරයක් සපයන්න.

03. ලාංකේය ඡන්දස් ශාස්ත්‍රයෙහි ආරම්භය හා එහි විකාශනය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

04. පහත සඳහන් විරිත් හතරක (04) න්‍යායාත්මක ලක්ෂණ විභාග කරන්න.

(අ) යා ගී විරිත

(ආ) බමර ගී විරිත

(ඇ) උමතු ගී විරිත

(ඈ) පියුම් ගී විරිත

(ඉ) සමුදුරුගොස් විරිත

05. අභිමත ඕනෑ ම සිව්පද විරිතකට අනුව "අපේ විශ්වවිද්‍යාලය" යන මැයෙන් කවි තුනකට නොඅඩු නිර්මාණයක් කරන්න.

2|6

06. අර්ථාලංකාර යනු කවරේ දැයි සංක්ෂිප්ත ව හඳුන්වා උපමා හා රූපක අතර සාම්‍යා සාම්‍යතාව පරීක්‍ෂා කරන්න.

07. සිදත් සඟරාවෙහි අන්තර්ගත කාව්‍ය දෝෂ පිළිබඳ ප්‍රාමාණික විවරණයක් සපයන්න.

08. පහත සඳහන් පද්‍යයෙහි ඉෂ්ටානිෂ්ට ලක්ෂණ විභාග කරන්න.

සතවෙත සුවදෙන ලොව්තුරු දහම ද සම්බුදු සසුන ද සුරකිමිනා
මෙත සිත පොබකළ බරනෙත් දෙවිඳුනි රුහුණු පුරවරේ වැඩ සිටිනා
ඉත ගුණ හද රැඳි තෙහංස දිල්තිණි දියණිගෙ ග්‍රහ දොස් දුරලමිනා
හිත සවිමත් කොට දිරිය වඩනු මැන ජය පිට ජය අත්කර දෙමිනා

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි.)

@@@@@@@@@